# 2026 පෙබරවාරි මස 12 දින වත්තේගම නගර සභා රැස්වීම් ශාලාවේ දී පැවති මහා සභා වාර්තාව

- **සහභාගී වීම**

1. ඩී.එස්. උයන්ගොඩ මහතා - ගරු සභාපති
2. එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී
3. ඒ.එම්. මොනිකා අබේකෝන් මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රී
4. ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී
5. බී.ඒ.දුමින්ද පෙරේරා මහතා - ගරු නගර සභා මන්ත්‍රී
6. ට්.ජී.ජේ. ආරියවංශ මහතා - ගරු නගර සභා මන්ත්‍රී
7. ඒ.ජී.ආර්. ගුණවර්ධන මහතා - ගරු නගර සභා මන්ත්‍රී
8. ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මහතා - ගරු නගර සභා මන්ත්‍රී
9. ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මහතා - ගරු නගර සභා මන්ත්‍රී
10. ඩී.ජී.එස්. විජේසූරිය මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රී
11. අයි.එම්.එස්.ආර්. රණසිංහ මහත්මිය - ගරු නගර සභා මන්ත්‍රී
12. ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මහතා - ගරු නගර සභා මන්ත්‍රී
13. ඩබ්.ටී. රාජමන්ත්‍රී මහතා - ගරු නගර සභා මන්ත්‍රී
14. ඩබ්.එම්.ඒ.බී. විරකෝන් මහතා - ගරු නගර සභා මන්ත්‍රී
15. වී.බී.වස්ගේවත්ත මහතා - ලේකම්

- සහභාගී නොවීම -

01. ජේ.ඒ.යූ. ගමගේ මහතා, - ගරු උප සභාපති
02. සී.ඩී. ගුරුගල්ගේ මහතා - ගරු නගර සභා මන්ත්‍රී

ගරු සභාපති ඩී.එස්. උයන්ගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු පෙ.ව 10. 00 ට ආරම්භ විය.

(අ)

**1. 2026.01.13 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ස්ථිර කර ගැනීම**

1.1 පළමුව 2026.02.12 දින න්‍යාය පත්‍රයේ පිටු අංක 16,17,18 හා 19 දක්වා යම් අඩුපාඩුවක් ඇති බැවින් මෙම න්‍යාය පත්‍රයෙන් ඉවත් කරනවා. අනෙකුත් කරුනු අද දින සාකච්ඡා කරනවා.

1.2 ඒ අනුව න්‍යාය පත්‍රානුකූලව මුලින්ම ඇත්තේ 2026.01.13 දින පැවති මහා සභා වාර්තාව ස්ථිර කර ගැනීම බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදි.

1.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

1.5 <u>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා</u>
ගරු සභාපතිතුමනි, 2025.12.11මහා සභා වාර්තාදේ පෙන්වා දෙනු ලැබූ යම් යම් සංශෝධන වලට යටත්ව ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. නමුත් වාර්ථාවේ සඳහන් වෙනවා හඬ පටයට අනුව මෙම වාර්ථාවේ කිසිදු සංශෝධනයක් අවශ්‍ය නොවේ කියලා.

1.6 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
ඉතින් මන්ත්‍රිතුමා මේ කියලා තියෙන්නේ හඬ පටයේ තියෙන්නේ ඔබතුමා සඳහන් කරපු දේවල් නෙවෙයි, හඬ පටය අනුව වාර්තාව නිවැරදි කියලා.

1.7 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

1.8 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් 2026.01.13 දිනැති මහා සභා වාර්ථාව සංශෝධන රහිතව ස්ථිර කරන ලදි.

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2026.01.13 දින පැවති මහා සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

(ඉ) නගර සභාව අමතා එවන ලද ලිපි, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

(උ) විධිවූ පරිදි කලින් ලියා එවා තිබෙන ප්‍රශ්න - **නැත**

(එ) විධිවූ පරිදි කලින් ලියා එවා තිබෙන යෝජනා

01. **<u>ගරු සභාපති ඩී.එස්. උයන්ගොඩ මහතාගේ යෝජනා</u>**

1. වත්තේගම නගර සභාවේ අනුමත කාර්යමණ්ඩලය තුළ රියදුරු තනතුරු 05ක් අනුමතව ඇති නමුත් මේ වන විට තනතුරු 02 ක් පුරප්පාඩු වී පවතී. දෛනිකව රාජකාරි කටයුතු පවත්වාගෙන යාමේදී රියදුරන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙනත් තනතුරු දරණ පහත නම් සඳහන් සේවකයන් රියදුරු රාජකාරි ආවරණය සඳහා යොදවා ගැනීම ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරන ලදි.
   - ඒ.ජේ. ගුණපාල මයා - කාර්යාල කාර්ය සහයක (පණිවිඩකරු)
   - ජී.ඩී.පී සුහසිංහ මයා - ජල කම්කරු

01.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථ්ර කරන ලදි.

01.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් දෛනික කටයුතු පවත්වාගෙන යාම සඳහා ඒ.ජේ.ගුණපාල මයා හා ජී.ඩී.පී සුහසිංහ මයා රියදුරු රාජකාරි ආවරණය සඳහා යොදවා ගැනීම ඒකමතිකව සභා සම්මත විය.**

2. වත්තේගම නගර සභාවේ ආයතනගත තොරතුරු වල දැනට පවතින පුරප්පාඩු හා අප්‍රේල් මස දක්වා විශ්‍රාම යාමට නියමිත සේවකයින් හේතුවෙන් ඇතිවන පුරප්පාඩු දෛනික පදනම මත සේවකයින් බඳවා ගැනීම, ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා විය.

| | | |
|---|---|---|
| I. | කාර්යාල කාර්ය සහයක | 01 |
| II. | ජල කම්කරු | 02 |
| III. | සෞඛ්‍ය කම්කරු | 01 |

01.2.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.2.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.2.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.ඒ.බී. විරකෝන් මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට පත් කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.2.4 කාරක සභා අවස්ථාවේ ලේකම්, වී.බී වස්ගේවත්ත මහතා විසින් ගරු මහා සභාව හමුවේ කරුණු පහදා දෙන ලදි.

01.2.5 පසුව කාරක සභාව, නැවත මහා සභාවක් කිරීමට ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යු.සෙතානි රාජමන්ත්‍රී මැතිතුමා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.දුමින්ද පෙරේරා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.2.6 පසුව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී. රාජමන්ත්‍රී මැතිතුමා විසින් මෙම යෝජනව ස්ථිර කරන ලදි.

01.2.7 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් පවතින පුරප්පාඩු මත දෛනික පදනම යටතේ සේවකයන් බඳවා ගැනීම ඒකමතිකව සභා සම්මත විය.**

3. 2026 වර්ෂයේ වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනය ක්‍රියාත්මක කිරීම සඳහා 2025.11.18 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමුකළ අතර,එහිදී ප්‍රතිශෝධනය සිදු කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන ඇතිනම් නැවත ලබා ගැනීම අවශ්‍ය නොවන බවත් එසේ නොමැතිනම් අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් දන්වා ඇත.ඒ අනුව ප්‍රතිශෝධනය කිරීමට පූර්ව අනුමැතිය ලබාගෙන නොමැති බැවින් 2026 වර්ෂයේ සිට නව තක්සේරු වටිනාකම මත වරිපනම් බදු අය කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරන ලදි.

01.3.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ර්.ජී.ජේ ආරියවංශ මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.
01.3.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.3.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ර්.ජී.ජේ ආරියවංශ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.
01.3.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2026 වර්ෂයේ නව තක්සේරු වටිනාකම මත වරිපනම් බදු අය කිරීම පිලිබඳ ආණ්ඩුකාර අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බව ඒකමතිකව සභා සම්මත විය.**

04. නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2022.05.26 දිනැති DDG/P2/PC/LA අංක දරණ ලිපිය මගින් සැලසුම් කමිටුව සඳහා සහභාගී වන සාමාජිකයින් සඳහා ගෙවනු ලබන දීමනාව වැඩිකර ගෙවීමට එකඟතාවය පළ කර ඇත.

- නගර සභා සඳහා දීමනාව රු. 1500.00 සිට රු. 2500.00 දක්වා පරාසය

ඒ අනුව සැලසුම් කමිටුව සඳහා 2022 .06.21 දිනැති ගරු මහ සභාවේ අනුමැතිය පරිදි ගෙවනු ලබන රු. 2000.00 ක දීමනාව රු. 2500.00 දක්වා වැඩිකර ගෙවීමට අනුමැතියට යෝජනා කරන ලදි

01.4.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.
01.4.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.4.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ර්.ජී.ජේ ආරියවංශ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.
01.4.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් සැලසුම් කමිටු දීමනාව රු.2,500.00 දන්වා වැඩි කිරීමේ යෝජනව ඒකමතිකව සභා සම්මත විය.**

05. ගබඩා තොග ලේඛණ වල පවතින දෝෂ හේතුවෙන් නව ලේඛන සකස් කිරීමට අදාල කමිටු වාර්ථාව අනුව විගණන කළමණාකරන කමිටු නිර්දේශය මත නව තොග ලේඛන පවතින ශේෂ අනුව නිවැරදිව ඇතුලත් කර සකස් කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු මහා සභාවට යෝජනා කරන ලදි.

01.5.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.5.2 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.5.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.5.4 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් ගබඩා තොග ලේඛන වල පවතින ශේෂ නිවැරදි කර නව තොග ලේඛණ සකස් කිරීමේ යෝජනාව ගරු මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

06. 2025.12.31 දිනට සකස් කරන ලද ණයහිමි උපලේඛණයෙන් 2022 වර්ෂයේ සිට ණයහිමි කර ඉදිරියට රැගෙන විත් ඇති "ආර්ථික අපහසුතා ඇති පාසල් දරුවන්ට පොත්පත් බෙදා දීම සඳහා වෙන්කර ඇති රු.2,500,000.00ක මුදල විවිධ ණයහිමි උපලේඛණයෙන් ඉවත් කිරීමට ගරු මහා සභාවට යෝජනා කරන ලදි.

එම්.යූ.එෆ්.රක්ෂානා,
කළමනාකරණ සේවා නිලධාරී (අවසන් ගිණුම් විෂය භාර),
වත්තේගම නගර සභාව
2026.02.10

ලේකම් තුමා මගින්
ගරු සභාපති තුමා,
වත්තේගම නගර සභාව,
වත්තේගම

**<u>අවසන් ගිණුමේ ඇති පැරණි ණය හිමි ශේෂ හා ණයගැති ශේෂ සම්බන්ධව ගරු මහා සභාවට යොමු කිරීම සඳහා සකස් කරන ලද සාධාරණීකරණ වාර්තාව</u>**

2024.12.31 දිනට ලබාදී ඇති කර්මාන්ත ණයහිමි උපලේඛනය අනුව 2020 වර්ෂයේ කර්මාන්ත 04ක් හා 2022 වර්ෂයේ කර්මාන්ත 01ක් ද දක්වා ඇත.

02. විවිධ ණය හිමි යටතේ 2018 වර්ෂයේ සහ 2022 වර්ෂයේ සටහන් 02ක් ඇත.එක් එක් කර්මාන්තයට අදාලව පැරණි ලේඛන ගත තොරතුරු පරීක්ෂා කිරීමෙන් අනතුරුව ණය හිමි ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා අනුමැතිය පතමි.

| අනු අං | කර්මාන්තයේ නම | වර්ෂය | මුදල |
|---|---|---|---|
| 01 | බාල මහතාගේ නිවස අසලින් දෙල්ගහලන්ද මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම | 2020 | රු.2,134.11 |
| 02 | 2020 පල්ලේපහුර ඉහළ යටවර දක්වා අලුතින් කැපූ මාර්ගය සංවර්ධනය කිරීම - සපිරි ගමක් - | 2020 | රු.10,960.09 |
| 03. | පින්නලන්ද ඇලවෙල්ල මාර්ගය සංවර්ධනය කිරීම - සපිරි ගමක් | 2020 | රු.43,656.83 |
| 04 | රාමචන්ද්‍ර ජනපදයේ සර්වෝදයේ අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම -සපිරි ගමක් | 2020 | රු.48,099.13 |
| 05 | බලහෙල ශ්‍රියාලතා මියගේ නිවස අසලින් පිහිටි මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 2022 | රු.45,592.87 |

- අනු අංක 01 හි සඳහන් බාල මහතාගේ නිවස අසලින් දෙල්ගහලන්ද මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම කර්මාන්තයසඳහා රු.2,134.11කමුදලක් ණයහිමි ලේඛනයේ 2020 ලෙස දක්වා ඇතත් එය 2019 වර්ෂයේ ගම්පෙරළිය වැඩසටහන යටතේ සිදු කර ඇති කර්මාන්තයකි.ලේඛනගත තොරතුරු වල ඡායා පිටපතක් අමුණා ඇත. ලැබුණු මුදල් සහ ගෙවූණු මුදල් අතර වෙනසක් නොවන බැවින් දිගින් දිගට ණයහිමි ලේඛනයෙන් ඉදිරියට ගෙන යෑම ගැටළුවකි.නැවත මෙම කර්මාන්තය වෙනුවෙන් මුදල් ලැබීමක් හෝ ගෙවීමක් සිදුවීමට හේතුවක් නොමැත.එබැවින් ණය හිමි ගිණුමෙන් ඉවත් කිරීමට උපදෙස් පතමි.(ඇමුණුම 01)

- අනු අංක 02 හි සඳහන් 2020 පල්ලේපහුර ඉහළ යටවර දක්වා අලුතින් කැපූ මාර්ගය සංවර්ධනය කිරීමසපිරි ගමක් -කර්මාන්තයේ රු.10,960.09ක ණය හිමි ශේෂයක් දක්වා ඇතත් ලැබුණු මුදල් සහ ගෙවූණු මුදල් අතර වෙනසක් නොවන බැවින් දිගින් දිගට ණයහිමි ලේඛනයෙන් ඉදිරියට ගෙන යෑම ගැටළුවකි.ලේඛනගත තොරතුරු වල ඡායා පිටපතක් අමුණා ඇත. නැවත මෙම කර්මාන්තය වෙනුවෙන් මුදල් ලැබීමක් හෝ ගෙවීමක් සිදුවීමට හේතුවක් නොමැත.මෙම කර්මාන්තය සඳහා බිල්පත් වටිනාකම අනුව රු.480,914.43 ක මුදලක් ලැබී අවසන් අතර රු.480,814.43 ක මුදලක් ගෙවා ඇත.එබැවින් ණය හිමි ගිණුමෙන් ඉවත් කිරීමට උපදෙස් පතමි.(ඇමුණුම02)

- අනු අංක 03 හි සදහන් පින්නලන්ද ඇලවෙල්ල මාර්ගය සංවර්ධනය කිරීම - සපිරි ගමක්කර්මාන්තයේ රු.43,656.83 කණය හිමි ශේෂයක් දක්වා ඇතත්, ලැබුණු මුදල් සහ ගෙවුණු මුදල් අතර වෙනසක් නොවන බැවින් දිගින් දිගට ණයහිමි ලේඛනයෙන් ඉදිරියට ගෙන යෑම හේතුවෙන් ලේඛනගත තොරතුරු වල ඡායා පිටපතක් අමුණා ඇත. නැවත මෙම කර්මාන්තය වෙනුවෙන් මුදල් ලැබීමක් හෝ ගෙවීමක් සිදු වීමට හේතුවක් නොමැත. එබැවින් ණය හිමි ගිණුමෙන් ඉවත් කිරීමට උපදෙස් පතමි.(ඇමුණුම 03)

- අනු අංක 04 හි සදහන් රාමචන්ද්‍ර ජනපදයේ සර්වෝදයේ අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම - සපිරි ගමක්කර්මාන්තයේ රු..48,099.13ක ණයහිමි ශේෂය 2025.12.31 දින උපලේඛනයට ඇතුලත් නොකිරීම සදහා ලේඛනවල පිටපත් ඉදිරිපත් කරමි.ණය හිමි ගිණුමෙන් ඉවත් කිරීමට උපදෙස් පතමි. (ඇමුණුම 04)

- අනු අංක 05 හි සදහන් බලහෙල ශ්‍රියාලතා මියගේ නිවස අසලින් පිහිටි මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරීම කර්මාන්තය 2022 වර්ෂයේ කර්මාන්තයකි.පොදු අරමුදල් කර්මාන්තයක් වන අතර බිල්පත් මුදලින් 50%ක් ගෙවා අතරදී මුදල් ද සමග ණය හිමි කර ඇත.මෙම මුදල ණය හිමි කර ඇත්තේ තත්ව පරීක්ෂණ වාර්තාව ලැබුණු පසු ගෙවීම් කිරීමට වන අතර මේ වන තෙක් තත්ව පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර නොමැති බව ගොනුවෙන් අනාවරණය වේ. වසර 03 කට වඩා පැරණි ණය හිමි ශේෂයක් වන බැවින් ණය හිමි උපලේඛනයෙන් ඉවත් කිරීමට උපදෙස් පතමි. (ඇමුණුම 05)

## විවිධ ණය හිමියෝ

- උසාවි දඩ උපලේඛන ගාස්තු වශයෙන් 2018 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන රු .1800.00 ක ශේෂය සම්බන්ධව ලිඛිත සාක්ෂි නොවේ.
- ආර්ථික අපහසුතා ඇති පාසල් දරුවන්ට පොත් පත් බෙදාදීම වෙනුවෙන් 2022 වර්ෂයේ සිට ඉදිරියට ගෙන යන රු.2,500,000.00 ක මුදල සදහා කිසිදු ණය හිමි බැදීමක් නොමැත.2022වර්ෂයේදී දෙපාර්තමේන්තුවෙන් ලද ලිපියක් අනුව මෙම මුදල ණයහිමි කර ඇත.2023 වර්ෂයේදී ක්‍රියාත්මක වී නොමැත. ඉදිරියට ණයහිමි උපලේඛනවලින් ඉවත් කිරීමට උපදෙස් පතමි.(ඇමුණුම 06)

එම්.යූ.එෆ්.රක්ෂාණා,
කළමනාකරණ සේවා නිලධාරී (අවසන් ගිණුම් විෂය භාර),
වත්තේගම නගර සභාව

01.06.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.6.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.6.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට පත් කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.6.4 කාරක සභා අවස්ථාවේ ලේකම්, වී.බී වස්ගේවත්ත මහතා විසින් ණයහිමි කර ඉදිරියට ගෙනවිත් ඇති රු.2,500,000.00 ක ශේෂය 2022 වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් ඇති බවත්, ඊට පෙර 2018 හා 2020 වර්ෂයන්හි සිට ණයහිමි කර ඇති උපලේඛණ පිළිබඳවත් තොරතුරු ගොනු කරන ලද සාධාරණීයකරන වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කර ඇති බවත්, මෙම ණයහිමි මුදල් දිගින් දිගටම ඉදිරියට ගෙනයාම අනවශය බවත් පෙන්වා දෙන ලදි. මේ සම්බන්ධයෙන් විගණනයෙන් ලද උපදෙස් මත එම ණයහිමි මුදල් නැවත සභා අරමුදලට බැර විය යුතු බවත් පෙන්වා දෙන ලදි.

01.6.5 පසුව කාරක සභාව, නැවත මහා සභාවක් කිරීමට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.6.6 පසුව ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජේ ආරියවංශ මැතිතුමා විසින් මෙම යෝජනව ස්ථිර කරන ලදි.

01.6.7 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් අවසන් ගිණුමේ ඇති පැරණි ණයහිමි මුදල් ආදායමට ගැනීමට ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදි.**

07. 2025.12.31 දිනට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ගරු මහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදි.

01.7.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.7.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.7.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.7.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය**

08. 2025.12.31 දිනට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාණ්ඩ වෙන්දේසියට හා භාණ්ඩ අපහරනය කිරීමට අදාල මණ්ඩලය සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් සමන්විත මණ්ඩලය ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

| | | | |
|---|---|---|---|
| I. | ප්‍රජා සංවර්ධන නිළධාරී | - | ආර්.ඒ.එස් පල්ලේවෙල මහතා |
| II. | වැඩ අධිකාරී | - | එස්.එම්.ඊ.සී.බී සමරකෝන් මහතා |
| III. | ආදායම් පරීක්ෂක | - | එස්.එච්.එම්.එම්.කේ සෙනරත් මැණිකේ මිය |
| IV. | අභ්‍යන්තර විගණන නිළධාරි | - | තරංගා ජයසුන්දර මිය |
| V. | මිශ්‍ර ආදායම් විෂය නිළධාරී | - | ඒ.එම්.එෆ් ෆාරිසා මෙය |

01.8.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.

01.8.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

ඒ වගේම මෙම කටයුත්තේ විනිවිධභාවය සඳහා මන්ත්‍රීවරයකුත් නම්කර ගැනීම සුදුසු බැවින් මේ සඳහා නමක් යෝජනා කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

01.8.3 ඒ අනුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.ආර්.එස් රාජමන්ත්‍රි මැතිතුමා විසින් යෝජනා කරන ලදි, පසුව එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.8.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.8.5 <u>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, අපිට හිටිය ආදායම් පරීක්ෂක විශ්‍රාම ගියා ඉතින් දැන් ඒ තනතුර සඳහා ආදායම් පරීක්ෂක වරයෙක් හෝ වරියක් එනවද කියලා මම දැනගන්න කැමතී.

01.8.6 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
මන්ත්‍රීතුමා මෙතුමිය විශ්‍රාම ගියේ හදිසියේමයි මොකද තව අවුරුද්දක් කාලය තියෙද්දි විශ්‍රාම ගියේ. ඉතින් පළාත් පාලන සහකාර කොමසාරිස් විමසීමේදී එතුමිය ප්‍රකාශ කලේ කෙනෙක් ඉන්නවානම් හොයලා කියන්න, තාවකාලිකව හරි ගෙන්නා ගන්න. ඒ අනුව අපි තාවකාලිකව හරි හොයමින් පවතිනවා මොකද අපිට අවශ්‍යම තනතුරක් මේක.

01.8.7 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී එච් ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.8.8 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබෙද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් භාණ්ඩ වෙන්දේසියට හා භාණ්ඩ අපහරණය කිරීමට අදාලව නම් කල මණ්ඩලය සුදුසු බවට ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදි.**

09. ඉතා දීර්ඝ කාලයක් එනම් 1990 සිට අවසන් ගිණුමෙහි සඳහන් ශේෂය ලෙස ඉදිරියට ගෙනවිත් දෝශ සහිතව සකස් කර තිබූ අවසන් ගිණුම නිවැරදි කිරීම සඳහා 2025.12.31 දිනට සකස් කළයුතු අවසන් ගිණුම සඳහා ලබා දියයුතු පහත උපලේඛණ නිවැරදිව - සත්‍ය ශේෂය අනුව සකස් කර ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

| | | | |
|---|---|---|---|
| I. | ලී බඩු සවි කිරීමේ උපලේඛනය | - | 8,414,709.79 |
| II. | කාර්යාල උපකරණ උපලේඛනය | - | 1,090,488.96 |
| III. | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ උපලේඛනය | - | 17,227,331.45 |
| IV. | ඉඩම් උපලේඛනය | - | 86,460,000.00 |
| V. | ගොඩනැගිලි උපලේඛනය | - | 37,950,000.00 |

01.9.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.9.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.9.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.9.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් දොෂ සහිතව සකස් කර තිබූ අවසන් ගිණුමෙහි උප ලේඛණ නිවැරදිව සකස්කර ගිණුම්ගත කිරීමේ යෝජනව ඒකමතිකව සභා සම්මත විය**

- **ගරු නගර සභා මන්ත්‍රී අයි.එම්.එස්.ආර් රණසිංහ මැතිනිය පෞද්ගලික අවශ්‍යතාවයක් හේතුවෙන් සියළුදෙනාගේ කැමැත්ත ඇතුව ගරු මහා සභාවෙන් පෙ.ව 10.35ට පිටව යන ලදි.**

10. 2025.12.31 දිනට අවසන් ගිණුම් සකස් කිරීමේදී 2024 වර්ෂය දක්වා ලබා දී ඇති උපලේඛණ ගත තොරතුරු වල නිවැරදි කිරීම් සිදු කිරීමට ගරු මහා සභාව වෙත ඉදිරිපත් කරමි.
    I. මිශ්‍ර තැම්පතු උපලේඛණයේ ඇති රු.153,538.62ක මුදල ආදායමට ගැනීම
    II. වෙළඳ ආරක්ෂණ තැම්පතු ගිණුමේ උපලේඛණයේ කිසිදු විස්තරයක් සඳහන් නොමැති රු.806,938.31ක මුදල ආදායමට ගැනීම
    III. කර්මාන්ත හා විවිධ ණයගැති ශේෂය හඳුනාගත නොහැකි පැරණි ණයගැති, ශේෂ වීම හේතුවෙන් කපා හැරීමට ඉදිරිපත් කිරීම (රු.1,751,723.80).
    IV. විවිධ ණයහිමි උපලේඛණයේ 2018 වර්ෂයේ ඉදිරියට ගෙන ඇති රු.1800.00 ක මුදල කපා හැරීම, හා මීටර් සඳහා හිඟ ලෙස ඉදිරියට ගෙන ගොස් ඇති රු.1,1602.06ක මුදල කපා හැරීම.

01.10.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.10.2 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

මේ පිළිබඳ විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.10.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට පත් කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.10.4 කාරක සභා අවස්ථාවේ ලේකම්, වී.බී වස්ගේවත්ත මහතා විසින් එක් එක් කරුණු පිළිබඳව විග්‍රහයක් කරන ලදි. ඒ අනුව,

I. 2019 වර්ෂයේ සිට මිශ්‍ර තැම්පතු උප ලේඛණයෙන් ගිණුම් ගත වී ඇති මුදලින් ඉදිරියට හිලව් කර ඇති විදුලි තැම්පතු මුදල් හැර මේ වන තෙක් ගෙවීමට ඉදිරිපත් නොවූ ඉතිරි තැම්පතු මුදල් පමණක් ආදායමට ගැනීමට හැකි බව පෙන්වා දෙන ලදි.

II. වෙළඳ ආරක්ෂක තැම්පත් ගිණුමේ උප ලේඛණ වල කිසිදු විස්තරයක්, සඳහන් නොවන රු.806,938.31ක මුදල 2018 වර්ෂයට පෙර සිටම ගිණුම් ගත වී ඇති අතර එම මුදල දිගින් දිගටම උප ලේඛණයේ සඳහන්කර ඉදිරියට ගෙන ඒම නිවැරදි විය යුතු බැවින් ආදායමට ගැනීමට හැකි වන බව පෙන්වා දෙන ලදි.

III. අවසන් ගිණුම සඳහා ලබා දී ඇති ණයගැති උප ලේඛණ වලින් 1990 වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් ඇති ඉතා පැරණි ණයගැති ශේෂ සම්බන්ධයෙන් පැරණි ගොනු සියල්ල පරීක්ෂා කළයුතු බවත්,ඒ අනුව හඳුනාගත හැකි ශේෂ හඳුනාගෙන සියළුම ණයගැති ශේෂ පිළිබඳ සාධාරණීයකරන වාර්ථාවක් සකස් කර ඉදිරි මහා සභාවට යොමු කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.

මේ සම්බන්ධයෙන් විගණනයෙන් ද විමසීම් කළ අතර අවසන් ගිණුම් ප්‍රකාශ සකස් කිරීමේදී සිදුවී ඇති වැරදි නිවැරදි කර සකස් කළ යුතු බව පෙන්වා දුන් බවත් ඒ අනුව නිවැරදි ගිණුමක් සකස් කිරීමේ අවශ්‍යතාවය පවතින බවත් වැඩිදුරටත් කරුණු පැහැදිලි කරමින් ප්‍රකාශ කරන ලදි.

01.10.5 පසුව කාරක සභාව, නැවත මහා සභාවක් කිරීමට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.10.6 පසුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් මෙම යෝජනව ස්ථිර කරන ලදි.

01.10.7 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් පළාත් පාලන ගණකාධිකාරීතුමාගෙන් විමසීම් කිරීමෙන් හා විගණනයෙන් උපදෙස් ලබා ගනිමින් ණයගැති ශේෂ සම්බන්ධයෙන් ඉදිරියේදී තීරණයක් ගැනීමටත්, තැම්පත් ගිණුමේ හා ණයහිමි ගිණුමේ හදුනාගත් ශේෂයන් අනුව අදාල මුදල් ආදායමට ගැනීම සුදුසු බවත් ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදි.**

11. මප/ප.පා.කො චක්‍රලේඛ අංක2019/13 යටතේ 2025 වර්ෂයේ බිල් කළ වරිපනම් වටිනාකමින් 2025 වර්ෂය තුල රැස් කල ආදායම මත රු. 91,117.55ක දිරි දීමනාවක් හා 2025.01.01 දිනට පැවති හිග වරිපනම් බදු වටිනාකමින් 2025 වර්ෂය තුල රැස් කල හිග වරිපනම් ආදායම මත රු. 55,990.99 ක දීමනාවක් ගෙවිය යුතුව ඇත. අදාල දිරි දීමනා මුදල ගෙවීම සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභා අනුමැතියට ඉදිරිපත් කරන ලදි.

01.11.1ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රි ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.11.2<u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.11.3ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.ටී රාජමන්ත්‍රි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.11.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2025 වර්ෂයේ රැස්කළ වටිනාකම මත වරිපනම් දිරි දීමනාව ගෙවීමේ යෝජනව ඒකමතිකව සභා සම්මත විය**

4. වත්තේගම, නුවර පාර්, අංක 37 දරණ ස්ථානයේ ඉන්දන පිරවුම් හල අසල පිහිටි බිම් කොටස , වත්තේගම - කුඩුගල පාර අංක 21/04 හි පදිංචි එල්.එච් අයිරාංගනී මිය වෙත කෙටිකාලීන බදු පදනම වන (2023.04.01 – 2026.03.31 දක්වා) බදු ලබා දී ඇත. මෙම බිම් කොටසේ බදු ගිවිසුම් කාලය 2026.03.31 දිනෙන් අවසන් වේ.

   නමුත් එල්.එච් අයිරාංගනී මිය මෙම කාලය තවත් අවුරුදු 03ක කාලයක් සඳහා දීර්ඝ කර දෙන ලෙස ඉල්ලා ඇත.
   2026.03.31 දිනෙන් පසුව අදාල ස්ථානයේ හිස් භූමිය යලි සභාව වෙත පවරා ගැනීමේ යෝජනාව ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

01.12.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්.ඒ.බී. විරකෝන් මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.12.2<u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. ඒ වගේම අපි මුලදිම මේ පිළිබඳව තීරකයක් ගත්තනේ නේ ඉවත් කරනවා කියලා.

01.12.3 ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය

ගරු සභාපතිතුමනි, අපි කලින් කිව්වා වගේ මේ මාළු කඩේ ඉවත් කරමු.අපිට ඒක ලොකු පාඩුවක් වෙන්නේ නෑ. මොකද දැන් අපිට සති පොල තියෙනවා. ඒ ආදායම එන නිසා මාළු කඩෙන් නගර සභාවට අලාභයක් සිදු වෙන්නේ නෑ.

01.12.4ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා

මාළු කඩේ ඉවත් කරලා අපිට මේක අලෙවි ප්‍රවර්ධන( promotion area) කටයුතු සඳහා යොදා ගන්න පුළුවන්.

01.12.5ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.12.6 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

මේ සම්බන්ධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම නුවර පාර අංක 37 දරණ ස්ථානයේ මාළු කඩය ඉවත් කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය**

13. පොදු වෙළඳපොල අංක 14 දරණ ගව මස් කඩ කාමරය 2026 වර්ෂය සඳහා කෙටි කාලීන බදු පදනම මත (2026.01.01 – 2026.12.31) මාතලේ, තාරලන්ද පාර, අංක 4/3 හි පදිංචි ඒ.එම් රාසික් යන අයට බදු දෙන ලදි.

ටෙන්ඩර් මුදල රු.782,150/- වන අතර මාසික කුලිය රු.65,179.16 වේ. ඒ අනුව ගවමස් අලෙවියෙන් ආදායමක් නොමැති බැවින් මාසික කුලිය රු.45,000/- දක්වා අඩුකරන ලෙස ඉල්ලා ඇති බැවින් එම යෝජනාව ගරු මහා සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

01.13.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ර්.ජී.ජේ. ආරියවංශ මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.

01.13.2 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.13.3 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා

ගරු සභාපතිතුමනි අපි මේ මුදල දැනට අඩු කරලා පසුව වාර්ෂිකව සියයට ප්‍රමාණයක් වැඩි කිරීමට කටයුතු කරමු. මොකද මෙම කඩය වහල දානවට වැඩිය යම් මුදලක් හෝ ලැබෙන එක වාසිදායක බැවින්.

01.13.4 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් මහා සභාව කාරක සභාවක් බවට පත් කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.13.5 කාරක සභා අවස්ථාවේ ලේකම්, වී.බී වස්ගේවත්ත මහතා හා විෂය භාර නිළධාරී ඒ.ෆ්.ෆ් ෆාරිසා මෙය විසින් ගරු මහා සභාව හමුවේ කරුණු පහදා දෙන ලදි.

01.13.6 පසුව කාරක සභාව, නැවත මහා සභාවක් කිරීමට ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් මොනිකා මැතිනිය යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.13.7 පසුව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් රු.55,000.00 ක මාසික කුලියක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලද යෝජනව ස්ථිර කරන ලදි.

01.13.8 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් පොදු වෙළඳපොල අංක 14 දරණ ගව මස් කඩයේ මාසික කුලිය රු.55,000.00ක් ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදි.**

**12.** <u>පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් CPC/ACLG/K/AM/10/01/5 අංක දරන 2026.01.26 දිනැති මහා සභා වාර්තා සඳහා නිරීක්ෂණ ලබා දීම - 2025.07.08 මහා සභාව යන මැයෙන් එවන ලද ලිපියෙහි සඳහන් නිරීක්ෂණ අනුව නැවත සංශෝධන ලෙස ඉදිරිපත් කළ යුතු යෝජනා ගරු මහා සභාවේ අනුමැතිය සඳහා යෝජන කරමි.</u>

I. (එ.01.1) වත්තේගම නගර සභාවෙහි 2013.01.01 දින අනුමත කාර්ය මණ්ඩලය අනුව නගර සභා ලේකම් තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයට (11/111) අයත් තනතුරක් වන බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක CPC/PSC/39/MC/UC/රාජකාරි ඉටු කිරීම හා 2025.06.04 දිනැති ලිපිය මඟින් 2025.03.21 දින සිට 2025.09.20 දින දක්වා පරිපාලන නිලධාරි වී.බී.වස්ගේවත්ත මහතා ලේකම් තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කර ඇත.

වී.බී.වස්ගේවත්ත මහතා, ලේකම් තනතුරේ රාජකාරි ඉටු කිරීමේ එම කාල සීමාව 2025.09.21 දින සිට 2026.03.20 දින දක්වා තව දුරටත් මාස 06 ක කාලයක් දීර්ඝ කිරීම ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරන ලදි.

II. (එ.01.2) වත්තේගම නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරේ සේවය කළ ඊ.එම්.එස්.එන්.කේ.හේරත් මිය 2025.03.02 දින විශ්‍රාම යාම හේතුවෙන් එම තනතුර පුරප්පාඩු වී ඇත.
නැවත බඳවා ගැනීම් සිදු කරන තුරු මෙම පුරප්පාඩුව සඳහා දෛනික පදනම මත සේවකයෙකු බඳවා ගැනීම ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරන ලදි.

III. (එ.01.3) ම.ප/ප.පා.කො.චක්‍රලේඛ 05/2010 (1) අනුව වත්තේගම නගර සභාවේ ගරු සභාපතිවරයාගේ සහය සඳහා සම්බන්ධීකරණ නිළධාරියකු බඳවා ගැනීමට අවශ්‍ය වන බව ගරු මහා සභාවට යෝජනා කරන ලදි.

IV. (එ.01.4) ම.ප/ප.පා.කො.චක්‍රලේඛ 05/2010 (1) අනුව බඳවා ගනු ලබන සම්බනධීකරණ නිළධාරියා සඳහා ගෙවිය හැකි උපරිම මුදල රු 25.000.00 ක් ලෙස ම.ප ගරු ආණ්ඩුකාර ලේකම්ගේ සී.පී.සී /02/01/111 හා 2019.04.08 දිනැති ලිපිය අනුව මුදලක් ගෙවීමට යෝජනා කරන ලදි.

V. (එ.01.5) වත්තේගම නගර සභාවේ අනුමත රියදුරු කාර්ය මණ්ඩලය 05 වන අතර මේ වනවිට රියදුරන් 03 දෙනෙක් පමණක් සිටින බැවින් රියදුරන් බඳවා ගැනීමට අවශ්‍ය වන බව ගරු මහා සභාවට යෝජනා කරන ලදි.

VI. (එ.02.1) පුස්තකාල සහයකගේ ඉල්ලීම අනුව 2025.06.24 දින පැවති නිවාස හා ප්‍රජා පහසුකම් කමිටුවේදී කරන ලද සාකච්ඡාවට අනුව, කමිටු සාමාජිකයන් විසින් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ වාර්තාව උපලේඛණ 1 හි සඳහන් නිරීක්ෂණයන් ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරන ලදි.

VII. (එ.02.2) 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා 17, 2025.06.25 පැවති කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කරන ලදි. කර්මාන්ක කමිටු සාමාජිනයන්ගේ නිර්දේශය වූයේ එම සංවර්ධන යෝජනා ඉටු කිරීමට හැකියාව ඇති බල ප්‍රදේශයේ අනුමත සමිති මඟින් ඉටුකිරීම සුදුසු බවට යෝජනා කරන ලදි.

VIII. (එ.02.3)ගරු නාගරික මන්ත්‍රිවරුන් විසින් ඉදිරිපත් කර ඇති උපලේඛණ 2 හි සඳහන් යෝජනා 17 සඳහා සභා අරමුදලේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් අවශ්‍ය කටයුතු කිරීම සඳහා වෙනත් මූලාශ හරහා මුදල් ප්‍රතිපාදන වෙන් කර ගැනීමට යෝජනා කරන ලදි.
ගලදෙණිය ප්‍රදේශයේ නිවාස 60කට ආසන්න ප්‍රමාණයකට ඉඩම් සඳහා ඔප්පු නොමැති අතර එම ජනතාව වසර 30කට වැඩි කාලයක් එම ස්ථාන වල පදිංචිව සිටින අතර වරිපනම් අංක ලබා දී ඇත. ජල බිල්, විදුලි බිල්පත් හා වරිපනම් බිල්ද ගෙවීම් කරන බැවින් එම පදිංචිකරුවන්ට ඔප්පු ලබා දීමට කටයුතු කිරීම පිලිබඳව 2025.06.24 නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාවට ඉදිරිපත් කල අතර එහි නිර්දේශය අනුව එම ඉඩම් වලට අදාල , දැනට සකස් කර ඇති ඉඩමේ පිඹුරුපත සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දීමට මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

IX. (ඕ.02.1) ඩෙංගු මර්ධණ කටයුතු සඳහා යොදවාගෙන ඇති යූ.ඒ දිසානායක මහතාගේ 2025.06.01 සිට 2025.07.03 දක්වා ජූනි මස දෛනික වැටුප ගෙවීම සඳහා ගරු සභාවේ අනුමැතියට යෝජනා කරමි.

01.14.1ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රි බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.14.2<u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

<u>01.14.3 ගරු නගර සභා මන්ත්‍රි ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා මේ ඉන්න හැමෝම නවක මන්ත්‍රිවරුන්. ඉතින් පෙර හුරු පුරුදු වීම් තමා අපි දිගටම ගෙන යන්නේ. ඒ නිසා මේ මුල් අවස්ථාවෙම වැරදි නිවැරදි කර ගන්න , විමර්ෂන නිළධාරීන් හා දැනුම තියෙන පුද්ගලයන් අරගෙන හැකි ඉක්මනින් මේ පිළිබඳව දැනුවත් කිරීමේ විශේෂ වැඩමුළුවක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියාලා මා ඉල්ලි සිටිනවා.

01.14.4 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

ස්තුතිය ගරු මන්ත්‍රීතුමා. ඒ වගේම මේක අපේ අඩුපාඩුවක් කියන්නත් බෑ. මේ වැරදි අපිට මීට පෙර හදා ගන්න තිබ්බා මේ පිළිබඳව විමර්ෂණ වාර්තා කලින් අපිට ලැබුනනම්. නමුත් එයාලගෙත් වැඩවර්ජනයක් ක්‍රියාත්මක වීම හේතුවෙන් පමා උණා කියලා තමා කිව්වේ.

01.14.5 ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට පත් කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර්. ගුණවර්ධන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.14.6 කාරක සභා අවස්ථාවේ ලේකම්, වී.බී වස්ගේවත්ත මහතා හා විසින් ගරු මහා සභාව හමුවේ කරුණු පහදා දෙන ලදි.

01.14.7 පසුව කාරක සභාව, නැවත මහා සභාවක් කිරීමට ගරු නගර සභා මන්ත්‍රී එච්. ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් මොනිකා මැතිනිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.14.8 පසුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.14.9 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් CPC/ACLG/K/AM/10/01/5 අංක දරණ 2026.01.26 දිනැති මහා සභා වාර්තා නිරීක්ෂණ ලබා දිම - 2025.07.08 මහා සභා වාර්තා සඳහා නිරීක්ෂණ අනුව නැවත සංශෝධන ඉදිරිපත් කිරීම පිලිබඳ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය**

13. .පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් CPC/ACLG/K/AM/10/01/5 අංක දරන 2025.12.30 දිනැති මහා සභා වාර්තා සඳහා නිරීක්ෂණ ලබා දීම - 2025.10.14 මහා සභාව යන මැයෙන් එවන ලද ලිපියෙහි සඳහන් නිරීක්ෂණ අනුව නැවත සංශෝධන ලෙස ඉදිරිපත් කළ යුතු යෝජනා ගරු මහා සභාවේ අනුමැතිය සඳහා යෝජන කරමි.

I. (එ.01.1) පොදු වෙළඳපොල කඩ කාමර, වත්තේගම බස් නැවතුම්පොලේ පොදු වැසිකිලිය, වත්තේගම පැරණි නගර සභා ගොඩනැගිල්ල යන ස්ථාන 2026 වර්ෂය වෙනුවෙන් කෙටි කාලීනව බදු දිය යුතු අවම ලංසුව වැඩි කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා වන යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශ මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි. (ඇමුණුම 09)

II. (එ.01.2) නව තක්සේරු ප්‍රතිශෝධනයේ ලේඛණ මේ වන විට ලැබී ඇති බැවින් නව තක්සේරු වටිනාකම් මත පදනම්ව 2026 වර්ෂයේ සිට වරිපනම් බදු අය කිරීම සඳහා වන යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරමි (ඇමුණුම 05).

III. (එ.01.3) නව වරිපනම් තක්සේරු ප්‍රතිශෝධය වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු වන රු. 857,310.67ක මුදලින් අදාල වැය ශීර්ෂය තුල ප්‍රමාණවත් නොවන රු. 826,210.59 ක මුදල ප්‍රතිපාදනය කර ගැනීම සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි. (ඇමුණුම් අංක 13)

IV. (එ.01.4) වත්තේගම නගර සභාව මගින් බෙදා හරිනු ලබන ජලය පරිභෝජනය කරන පාරිභෝගිකයන් වෙත නිකුත් කෙරෙන ජල බිල්පතෙහි ගණනය කිරීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම හා 2026 වර්ෂයට ජල ගාස්තු අය කිරීම සඳහා වන යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.(ඇමුණුම 06)

V. (එ.01.5) ජාතික විගණන උප කාර්යාලයේ විගණන අධිකාරීතුමිය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ 2022 වර්ෂය යටතේ ඇති “පෙර පාසලක්, සති පොළක් හා ළමා උද්‍යානයක් යනාදී මහජන උපයෝගී සේවාවන් කියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබීම” සම්බන්ධව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී නිර්දේශ වූ පරිදි,

සති පොළ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුලත් කමිටුවක් පිහිටුවීම සඳහා වන යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.
ළමා පුස්තකාලය තුල පෙර පාසලක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පිහිටුවා, ළමා පුස්තකාලය එම ගොඩනැගිල්ලේ ඉහල මහලට ගෙනගොස් පහල මහලෙහි පෙර පාසලක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සුදුසු බවට වන යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

VI. (එ.01.6) ජාතික විගණන උප කාර්යාලයේ විගණන අධිකාරීතුමිය විසින් ඉදිරිපත් කරන ලද අංක සීපීඑල්ජී/කේඩී/බී2025/පොදු දරණ 2025.09.23 දිනැති වාර්තාවේ 2024 වර්ෂය යටතේ ඇති, “2005 වර්ෂයේ අනතුරට පත් බැකෝ යන්ත්‍රය සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (4) පරීක්ෂණය අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් වසර 20 කට ආසන්න කාලයක සිට අදාල යන්ත්‍රය අළුත්වැඩියා නොකර විනාශ වීමට ඉඩහැර තිබීම” යන කරුණට අදාලව මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණයේ තීන්දුව ලෙස අදාල පාර්ශවකරුවන්ගෙන් අධිභාරය අයකර ගතයුතු බව දන්වා තිබුනද එම පාර්ශව විසින් එම තීන්දුව සම්බන්ධව නැවත අභියාචනා ගොනුකර ඇති අතර එයට පිළිතුරක් මෙතෙක් ලැබී නොමැත. එමෙන්ම බැකෝ යන්ත්‍රය ඇතුළු තවත් උපකරණ හා යන්ත්‍ර සූත්‍ර කොටස් කිහිපයක් විධිමත් පරිදි වෙන්දේසි කර අපහරණය කිරීම සඳහා අවශ්‍ය වන මූලික කටයුතු කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශ වූ පරිදි, ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.(ඇමුණුම 15)

VII. (එ.01.7) 2016 සිට 2024 කාලපරිච්ඡේදයට අදාල විගණන ඡේද සම්බන්ධ වර්තමාන තත්වය ඇතුලත් ජාතික විගණන උප කාර්යාලයේ විගණන අධිකාරීතුමිය විසින් ඉදිරිපත් කරන ලද අංක සීපීඑල්ජී/කේඩී/බී2025/පොදු දරණ 2025.09.23 දිනැති වාර්තාව පිළිබද සාකච්ඡා කර අවශ්‍ය නිර්දේශයන් ලබා ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

VIII. (එ.01.8) 2025 වර්ෂයේ කර්මාන්ත බදු මුදල් ගාස්තු ගැසට් නිවේදනය අනුව 2026 වර්ෂය සඳහා සංශෝධනය කරන ලද නව කර්මාන්ත බදු මුදල් ගාස්තු 2026 වර්ෂයේ ගැසට් නිවේදනයේ පල කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු මහ සභාවට යෝජනා කරමි.

IX. (එ.01.9) 2026 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමේ යෝජනාව

X. (එ.01.10) 2026 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව

XI. (එ.01.11) **රථ වාහන හා සත්ත්ව බද්ද පැනවීම යෝජනාව - 2026**

XII. (එ.01.12) 2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමේ යෝජනාව

XIII. (එ.01.13) **සේවා සඳහා ගාස්තු අය කිරීමේ යෝජනාව - 2026**

XIV. (එ.01.14) **2026 ගොඩනැගිලි අයදුම්පත් විෂයට අදාලව ගාස්තු පැනවීමේ යෝජනාව**
1986 නාගරික සංවර්ධන අධිකාරිය සැලසුම් හා ගොඩනැගිලි නියෝග සංශෝධනය කරමින් ප්‍රකාශයට පත් කරන ලද අංක 2235/54 හා 2021.07.08 දිනැති ගැසට් පත්‍රයේ සඳහන් මිල ගණන් වලට අනුව 2026 වර්ෂයේ වත්තේගම නගර සභාවට ගෙවිය යුතු පහත සඳහන් ගොඩනැගිලි අයදුම්පත් විෂයට අදාළව අයකරනු ලබන ගාස්තු හා පරිසර බලපත්‍ර හා පරීක්ෂණ ගාස්තු අය කිරීමට සුදුසු බව ගරු මහා සභාවට යෝජනා කරමි. (ඇමුණුම 08)

XV. (එ.02.1) 2025.05.31 දින ගැසට් නිවේදනය අනුව වත්තේගම නගර සභාව සඳහා අභිනවයෙන් තේරී පත් වූ මහජන නියෝජිතවරුන් සඳහා නිළ මුද්‍රාව හා නිළ හැඳුනුම්පත සැකසීම සඳහා යෝජනා කරමි.

XVI. (එ.03.1) වත්තේගම නගර සභා පුස්තකාලය විවෘතව තබන දිනවලදී ප.ව 5.00න් පසුව පාඨකයින්ගේ පැමිණීම විග්‍රහ කරමින් පුස්තකාල විෂය භාර නිළධාරී විසින් ඉදිරිපත් කර ඇති 2025.09.22 දිනැති වාර්තාව 2025.09.23 දින පැවති නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාවය ඉදිරිපත් කර ඇති අතර. එම කාරක සභාවේ නිර්දේශය අනුව පුස්තකාලය විවෘතව තබන වේලාවන් පහත පරිදි සංශෝදනය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි. (2025.09.23 දිනැති නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභා වාර්තාවේ අනු අංක 03 - පිටු අංක 02)

XVII. (ඔ.03.1) නම්‍යශීලී ප්‍රතිපාදන යටතේ වත්තේගම නගරයේ ඇති පොදු වැසිකිලි පද්ධතිය සංවර්ධනය කිරීම (මි 2.5) හා වත්තේගම නගර සභාවට අයත් පොදු වෙළඳපොලේ වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම (මි 2.5) යන සංවර්ධන යෝජනා දෙක වෙනුවට වත්තේගම නගරයේ ඇති පොදු වැසිකිලි පද්ධතිය සංවර්ධනය කිරීම ලෙසින් යෝජනාව සංශෝධනයට ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට යොමු කර ඇති බව ගරු සභාව දන්වා සිටිමි.

XVIII. (ඔ.03.2) පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහන යටතේ පුංචිමෝල ජල ව්‍යාපෘති පෙරහන් යන්ත්‍රාගාරය ඉදිකිරීම හා සංවර්ධනය කිරීම යන කර්මාන්ත සඳහා මිලියන 06 ක් වෙන් වී ඇතත් ජල සම්පාදන මණ්ඩලයේ ඇස්තමේන්තුව මිලියන 30 කි. ඒ අනුව වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් වෙන් වී ඇති මෙම ප්‍රතිපාදන වල මුදල රාස්සැල්ල ජල යෝජනා ක්‍රමයේ පවතින රළු පෙරහන් ටැංකි සංවර්ධනය කිරීම ලෙසින් සංශෝධනයට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කර ඇත.

XIX. (ඔ.03.6) වත්තේගම නගර සභාවේ 2025 සභා පොදු අරමුදල යටතේ දෙල්ගහලන්ද ජස්ටින් මහතාගේ නිවස අසල පඩිපෙල සංවර්ධනය කිරීම යන කර්මාන්තය සඳහා 250,000.00 ක මුදලක් වෙන් කර ඇත. නමුත් එය පවතින තත්වය අනුව ක්‍රියාත්මක කිරීමට අපහසු වී ඇති බැවින්, මෙම ව්‍යාපෘතිය කුඩුගල පාර ග්‍රාමයේ නිවෙස් සඳහා දිවෙන පාර අළුත්වැඩියා කිරීම යන කර්මාන්ත සමඟ ඒකාබද්ධ කොට සිදු කිරීමට ප්‍රාදේශීය සම්බන්ධීකරන කමිටුවට යොමු කර ඇත.

XX. (ඔ.03.10) මෙවර සභාවට තේරී පත් වූ මන්ත්‍රීවරුන් වෙනුවෙන් සභාවේ අරමුදලින් ලිපි ශීර්ෂ මුද්‍රණය කර දීමට කටයුතු යොදන මෙන් යෝජනා කරමි.

<u>01.14.4 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

ස්තූතිය ගරු මන්ත්‍රීතුමා. ඒ වගේම මේක අපේ අඩුපාඩුවක් කියන්නත් බෑ. මේ වැරදි අපිට මීට පෙර හදා ගන්න තිබ්බා මේ පිළිබඳව විමර්ෂණ වාර්තා කලින් අපිට ලැබුනනම්. නමුත් එයාලගෙත් වැඩවර්ජනයක් ක්‍රියාත්මක වීම හේතුවෙන් පමා උණා කියලා තමා කිව්වේ.

01.14.10 ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට පත් කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර්. ගුණවර්ධන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.14.11 කාරක සභා අවස්ථාවේ ලේකම්, වී.බී වස්ගේවත්ත මහතා හා විසින් ගරු මහා සභාව හමුවේ කරුණු පහදා දෙන ලදි.

01.14.12 පසුව කාරක සභාව, නැවත මහා සභාවක් කිරීමට ගරු නගර සභා මන්ත්‍රී එච්. ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් මොනිකා මැතිනිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.14.13 පසුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.14.14 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් CPC/ACLG/K/AM/10/01/5 අංක දරණ 2026.12.30 දිනැති මහා සභා වාර්තා නිරීක්ෂණ ලබා දිම - 2025.10.14 මහා සභා වාර්තා සඳහා නිරීක්ෂණ අනුව නැවත සංශෝධන ඉදිරිපත් කිරීම පිලිබඳ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය**

**02. <u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මහත්මිය</u>**

i. අටලහගොඩ වලව්වත්තේ සිට රවන් ඔයට යන මාර්ගය වැසි කාලයේදී විනාශ වූ අතර රවන් ඔයට බැසීම සඳහා පඩිපෙලක් සකස් කර දෙන මෙන් ගරු මහා සභාවට යෝජනා කරමි.

02.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

02.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

02.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

02.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් රවන් ඔයට බැසීම සඳහා පඩිපෙලක් ඉදිකිරීමේ යෝජනව ඒකමතිකව සභා සම්මත විය**

02. අටලහගොඩ පදිංචි ප්‍රභාත් මහතාගේ නිවස ඉදිරිපිට කාණුවේ වතුර එම නිවසේ මිදුලට ගලා යන බැවින් කාණු පද්වතිය සකස් කිරීමට යෝජනා කරමි.

02.2.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී කී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

02.2.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

02.2.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

02.2.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් අටලහගොඩ පදිංචි ප්‍රභාත් මහතාගේ නිවස ඉදිරිපිට කාණු පද්වතිය සකස් කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය**

**03. <u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.ආර්.එස් රාජමන්ත්‍රී මහතා</u>**

I. 2026. සභා අරමුදල් යටතේ සිදු කිරීමට අපේක්ෂිත සංවර්ධණ යෝජනා මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි

03.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

03.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

03.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

03.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2026 සභා අරමුඅදල් යටතේ සිදු කිරීමට අපේක්ෂිත යෝජනා පිළිබඳ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය**

ii. 2025 වර්ෂයෙන් 2026 වර්ෂයට අවිච්ඡේද වූ සභා අරමුදල් යටතේ වූ කර්මාන්ත වල කාලය දීර්ඝ කිරීමට අදාලව නැවත ගිවිසුම්ගත වීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු මහා සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

03.2.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

03.2.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

03.2.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

03.2.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2026 වර්ෂයට අවිච්ඡේද වූ කර්මාන්ත වල කාලය දීර්ඝ කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය**

iii. 2026 වසරට ණයහිමි කරන ලද කර්මාන්ත තැම්පත් ලේඛණයේ ඇති තැම්පත් ආපසු ගෙවීම සම්බන්ධව වාර්ථාව මහා සභාව වෙත පදිරිපත් කරන ලදි.

03.3.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

03.3.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

03.3.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

03.3.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් තැම්පතු ලේඛණයේ ඇති තැම්පතු ආපසු ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය**

iv. මාතලේ උකුවෙල දුම්රිය හරස් මාර්ගය අසල සිට ඇල්කඩුව මාර්ගයේ හන්දිය දක්වා ජල නල එලීම යන කර්මාන්තය හංසන කන්ස්ට්‍රක්ෂන් වෙත පැවරීමෙන් අනතුරුව එය අතරමග නතර කර කර්මාන්තය අඩාල වීම සම්බන්ධයෙන් හංසන කන්ස්ට්‍රක්ෂන් ආයතනය අසාදු ගත ලේඛණයට ඇතුලත් (Black list) කරනවාද යන්න තීරණය කිරීමටත් නැවත එම කර්මාන්තය සිදු කරනවාද යන්න තීරණය කිරීමටත් මහා සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

03.4.1 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට පත් කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

03.4.2 කාරක සභා අවස්ථාවේ ලේකම්, වී.බී වස්ගේවත්ත මහතා හා විෂය නිළධාරි උඩුරාවණ මයා විසින් ගරු මහා සභාව හමුවේ කරුණු පහදා දෙන ලදි.

01.14.15 පසුව කාරක සභාව, නැවත මහා සභාවක් කිරීමට ගරු නගර සභා ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.14.16 පසුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් පවසන ලද්දේ එකවරම අසාදු ලේඛණ ගත නොකර ප්‍රමාදය පිළිබඳව කරුණු විමසීමක් කිරීම සුදුසු බවයි

01.14.17 පසුව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රි මැතිතුමා විසින් යෝජනව ස්ථිර කරන ලදි.

01.14.18 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් හංසන කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනය ගෙන්වා කරුණු විමසීමට ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදි.**

**04. <u>ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මහතා</u>**

I. පොදු වෙළදපොල කඩ කාමර 1,2,4,5 අළුතින් දොර පියන් යෙදීමට යෝජනා කරමි.

04.1.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රි බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.

04.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

04.1.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.ටී රාජමන්ත්‍රි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

04.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් පොදු වෙළදපොල කඩකාමර 1,2,4,5 සඳහා දොර පියන් දැමීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ii. මහා විද්‍යාල පාරේ පිහිටි අක්බාර් මිරිස් මෝල අසල කැඩී ඇති අඩි 60ක පමණ කාණුව කොන්ක්‍රීට් යොදා සංවර්ධණය කිරීමට යෝජනා කරමි.

04.2.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රි බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනව ස්ථ්‍ර කරන ලදි.

04.2.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

04.2.3 ඒ අනුව විවාදයක් සඳහා කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.ටී රාජමන්ත්‍රි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

04.2.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

මේ සම්බධයෙන් විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් මහා විද්‍යාල පාරේ සිට අක්බාර් මීරිස් මෝල දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

(ඔ) සෙසු කරුණු

1. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

i. ව්‍යාපාරික එකමුතුව,පොදු වෙළඳපොල,වත්තේගම මගින් 2026.01.21 දින මා වෙත එවන ලද "නගර සීමාව තුළ සති පොල පැවැත්වීම පිණිස" ලිපිය

01.1.1 ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජේ ආරියවංශ මැතිතුමා
ගරු සභාපතිතුමනි, මගේ අදහසනම් දැනය මෙම පොළ තියෙන ස්ථානය හොඳයි. අපි 16 දෙනාම කැමති වෙලයි මෙම ස්ථානය තොරගත්තේ, ඉතින් මෙම සතිපොළ පොදු වෙළඳපොළට ගෙනියන්නේ නැතුව මෙම ස්ථානයේම තියාගමු.

01.1.2 ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය
ගරු සභාපතිතුමනි, පොළ හොඳයට සිදු වෙනවා අති සාර්ථකයි, නමුත් මේ සඳහා පැමිණ සිටින්නේ මඩවල මුදලාලිලා. ඉතින් අපි අපේ නගර සීමාවේ අයට අවස්ථාව දෙන්න ඕන බඩු අලෙවි කරන්න. ඒ වගේම ප්‍රමිතියෙන් තොර එළවළු විකුණලා තියෙනවා. මොකද මට මහත්මයෙක් කිව්වා රු.500ට එළවළු මල්ලක් දුන්නාළු ඒ එළවළු වන ගෙදර යන ටිකට වතුර වැක්කෙරෙනවලු ඒ අනුව මේ පිළිබඳවත් මහජන සෞඛ්‍ය පරීක්ෂක කෙනෙක් ලබා පරීක්ෂා කිරීමක් කරන්න කියලා මම යෝජනා කරනවා.

01.1.3 ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා
ගරු සභාපතිතුමනි, ඔය කියන ප්‍රමිතියෙන් තොර එළවළු මල්ලක් මාත්, රාජමන්ත්‍රී මන්ත්‍රිතුමාත් හා ආරියවංශ මන්ත්‍රිතුමත් ගෙනිච්චා. ඉතින් මේ මල්ල දුන්නේ හවස 6.00 න් පසුව ඉතිරි උන එළවළු ටික දාලයි මේ මල්ල හැදුවේ. හැබැයි ඔය කියනවා වගේ ප්‍රමිතියෙන් තොර එළවළු මල්ලක් නෙවෙයි ඒක.
ඒ වගේම අපි අත්පත්‍රිකා බෙදන කොට නුවර, කටුගස්තොට, මඩවල,මාතලේ, දඹුල්ල, හුළුගග මේ හැමතැනටම බෙදුවා. ඒ අනවු මේ සඳහා ආවේ මඩවල මුදලාලි විතරයි. ඒවගේම අපේ අය කොච්චර දැනුවත්කරත් ආවේ නෑ පොළ වර්ජනය කළානේ.පසුව කරන ලද සාකච්ඡාවේ එයාලා කිව්වා පොළ නිසා එයාලට පාරිභෝගිකයො එන්නේ නෑ කියලා. ඉතින් ඒකට විසඳුමක් විදියට අපි පොදු වෙළඳපොල වෙළඳුන්ට කිව්වා මේ සඳහා එන්න තරගයක් දීලා බලන්න, ඒ සඳහා අපි ඔයාලා 05 දෙනාගෙන් කිසිදු අය කිරිමකින් තොරව කැමති ස්ථානය දෙන්නම් කියලා යෝජනා කරා මොකද දවස් 06ක් පොදු වෙළඳපොලේ විකුණලා සතියට එක දවසක් පොලේ ඉඳලා බලන්න කියන්න. ඒ වගේම දැනට මේ විදියටම කරගෙන යන්න දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට පත් කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.ආර්.එස් රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.1.4 කාරක සභා අවස්ථාවේ ලේකම්, වී.බී වස්ගේවත්ත මහතා විසින් ගරු මහා සභාව හමුවේ කරුණු පහදා දෙන ලදි.

01.1.5 පසුව කාරක සභාව, නැවත මහා සභාවක් කිරීමට ගරු නගර සභා ඩී.ජී.එස් විජේසූරිය මැතිනිය යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

2.කරන ලදි මාර්ග පවිත්‍ර කිරීමේ කාලසටහන ගරු සභාවේ දැනගනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**මාර්ග පවිත්‍ර කිරීම**

**කාලසටහන - 2026 පෙබරවාරි**

| අනු අංකය | දිනය | වේලාව | ස්ථානය/මාර්ගය | වගකීම | අධීක්ෂණය |
|---|---|---|---|---|---|
| 1 | 2026.02.02 | 10.30-2.30 | වල්අරඹ පාර | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 2 | 2026.02.03 | 10.30-2.30 | දෙල්ගහපිහිල්ල | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 3 | 2026.02.05 | 10.30-2.30 | මුදුනේගම්මැද්ද | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 4 | 2026.02.06 | 10.30-2.30 | කසළ අංගනය | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 5 | 2026.02.09 | 10.30-2.30 | දෙල්ගහලන්ද | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 6 | 2026.02.10 | 10.30-2.30 | ගලදෙනිය පඩිපෙල | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 7 | 2026.02.11 | 10.30-2.30 | අරලියලන්ද | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 8 | 2026.02.12 | 10.30-2.30 | පරණතැපැල්හල | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 9 | 2026.02.13 | 10.30-2.30 | ආදාහනාගාරය | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 10 | 2026.02.16 | 10.30-2.30 | අටලහගොඩ පාර | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 11 | 2026.02.17 | 10.30-2.30 | බලහෙල | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 12 | 2026.02.18 | 10.30-2.30 | නුවරතැන්න පාර පඩිපෙළ | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 13 | 2026.02.19 | 10.30-2.30 | රාමචන්ද්‍ර පාර | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 14 | 2026.02.20 | 10.30-2.30 | කාර්යාලය | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 15 | 2026.02.23 | 10.30-2.30 | පොල්ගස්පිටිය | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 16 | 2026.02.24 | 10.30-2.30 | නාරංදණ්ඩ පාර | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 17 | 2026.02.25 | 10.30-2.31 | ගුන්ඩු මාර්ගය | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 18 | 2026.02.26 | 10.30-2.32 | බන්නැක් පාර | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |
| 19 | 2026.02.27 | 10.30-2.33 | කසළ අංගනය | සංජීව මයා/අනුෂා මිය | ලේකම්තුමා |

සකස් කළේ
ඩී.ඒ.පී.කේ නානායක්කාර
පරිසර අංශය

වී.බී වස්ගේවත්ත
ලේකම්
වත්තේගම නගර සභාව

වී.බී.වස්ගේවත්ත
ලේකම්
නගර සභාව
වත්තේගම

03. ලංසු ඇගයීම් කමිටුව සඳහා පත් කර සිටි සාමාජිකයකු විශ්‍රාම යාම හේතුවෙන් නව සාමාජිකයකු පත් කර ගනීම හා විනිවිදභාවය ඇති කිරීම සඳහා මන්ත්‍රීවරයකු කමිටු සාමාජිකයකු ලෙස පත් කර ගැනීම.

**ලංසු ඇගයීම් කමිටුව සඳහා සාමාජිකයෙකු පත්කර ගැනීම**

2025.12.11 දින ගරු මහ සභාවේ තීරණ අංක (එ) 01.iv අනුව 2026 වර්ෂයේ වත්තේගම නගර සභාවේ ලංසු ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් මල්ලිකා සෙනරත් මහත්මිය පත් කරනු ලැබුවද, එම නිලධාරිනි 2026.02.09 දින විශ්‍රාම යාම හේතුවෙන් ලංසු ඇගයීම් කමිටුවේ එක් සාමාජිකයෙකු ඉවත්ව ඇත.

ඒ අනුව ලංසු ඇගයීම් කමිටු සාමාජිකයෙකු වශයෙන් කළමනාකරණ සේවා නිලධාරිනී තිලංකා වික්‍රමසිංහ මිය පත්කර ගැනීමේ යෝජනාව ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

වී.බී.වස්ගේවත්ත,

ලේකම්,

වත්තේගම නගර සභාව

වී.බී.වස්ගේවත්ත
ලේකම්
නගර සභාව
වත්තේගම

ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.ආර්.එස් රාජමන්ත්‍රී මන්ත්‍රීතුමා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජේ ආර්යවංශ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

4.පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4/4/ සංවර්ධන ව්‍යාපෘති 2025 හා 2026.01.26 දිනැති ලිපිය අනුව පළාත් නිශ්චිත ව්‍යාපෘති අනුමත කිරීම - 2026 අනුව පහත ව්‍යාපෘති අනුමත වී ඇති බව ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

වත්තේගම න.ස.

| වැඩසටහන | ව්‍යාපෘතිය | | අනුමත මුදල(රු.මි) |
|---|---|---|---|
| පළාත් මාර්ග | 1.1.1.34 To Develop Delgahapihilla road and Retaining wall Wattegama UC | දෙල්ගහපිහිල්ල මාර්ගය හා පැති බැම්ම සංවර් ධනය කිරීම.- වත්තේගම න.ස. | 4.00 |
| | 1.4.2.1 Construction of a culvert at the starting point of the Nuwaratenna Pittaniya Wattegama UC | නුවරතැන්න පිට්ටනිය ආරම්භක ස්ථානයේ බෝක්කුව සකස් කිරීම - වත්තේගම න.ස. | 1.50 |
| ඝන අපද්‍රව්‍ය | 3.4.1.1 Implementation of the compost production project at the garbage yard Wattegama UC | වත්තේගම නගර සභාවේ කසළ අංගනයේ කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. -වත්තේගම න.ස. | 25.66 |
| ප්‍රජා ජල | | රාස්සැල්ල ජල මූලාශ්‍රය නවීකරණය කිරීම,පෙරහන් ටැංකිවල පෙරහන් මාධ්‍ය ඉවත් කිරීම හා නව පෙරහන් මාධ්‍ය ස්ථාපනය කිරීම | 7.50 |
| | | පුංචිමෝල ජල මූලාශ්‍රය සඳහා පෙරහන් මාධය ඉදිකිරීම හා අනෙකුත් සංවර්ධන කටයුතු කිරීම | 10.00 |

2. කාරක සභා වාර්තා සලකා බැලීම
    I. 2026.01.20 දින පැවති නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාවේ වාර්තාව.
    II. 2026.01.20 දින පැවති පරිසර හා සෞඛ්‍ය කාරක සභාවේ වාර්තාව.
    III. 2026.01.21 දින පැවති කර්මාන්ත, ජල හා විදුලි කාරක සභාවේ වාර්තාව.
    IV. 2026.01.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ වාර්තාව.

3. මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසරය - ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා ඉන්දියාවට (පෞද්ගලික වන්දනා ගමනක්) යාම සඳහා සති 02ක කාලයක නිවාඩු ලබාගෙන ඇත.
   - ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා පෞද්ගලික අවශ්‍යතාවයක් මත නිවාඩු ලබාගෙන ඇත.

4. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.

04.1.1 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා

ගරු සභාපතිතුමනි අපි හැමෝම දන්නවා ආදායම් පරීක්ෂක මල්ලිකා සෙනරත්මැණිකේ මිය විශ්‍රාම ගියා. ඇය මෙම සභාවට අවංකව විශාල සේවාවක් ඉටු කරා. ඉතින් මේ අවස්ථාවේදී මම ඇයගේ විශ්‍රාම දිවියට නගර සභාව වෙනුවෙන් සුභ ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි වත්තේගම මධ්‍ය මහා විද්‍යාලයේ ආදිශිෂ්‍ය සංගමය, වත්තේගම මධ්‍ය මහා විද්‍යාලයේ සංවර්ධණයට විශාල සේවාවක් ඉටු කිරීමට කටයුතු කරලා තියෙනවා.ඉතින් මෙවැනි සංවර්ධන කටයුතු සඳහා මූලය ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස සංගීත ප්‍රසංගයක් සැලසුම් කළා ඒ අනුව මෙම වැඩ සටහන සඳහා විනෝද බද්ද යම් සහනදායී ක්‍රමයකට ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ජල සැපයුමේ තියෙන ගැටළු ඉක්මනින් නිරාකරණය කරගන්න කටයුතු කරමු කියලා. මොකද සමහර ස්ථාන වලට දින 10-12 ජලය ලැබිලා නෑ කියලා පැමිණිලි ලැබිලා තියෙනවා. ඔවුන් පවසන්නනේ පැමිණිලි කරත් ඇවිල්ලා බලලා කටයුතු කරන්නේ නෑ කියලා.

04.1.2. ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය

ගරු සභාපතිතුමනි 2026.02.05 දින මුදුනේගම්මැද්ද පවිත්‍ර කිරීමට යොදලා තියෙනවා නමුත් එදින කිසිදු පවිත්‍ර කිරීමක් සිදු උණේ නෑ.

ඒ වගේම ගරු සභාපතිතුමනි ජල බිල්පත් මාස දෙකකට වරක් ලැබෙන බවට කිහිප දෙනෙක් පැමිණිලි කරා. ඒ විදියට මාස දෙකක මුදල එකවර ලැබෙන විට ගෙවා ගැනීමේ අපහසුතාවයක් පවතින බව ඔවුන් පැවසුවා.ඒ අනුව මාස්පතා බිල ලැබෙනවානම් හොදයි කියලා ඔවුන් යෝජනා කලා.

5. ගරු සභාපතිතුමාගේ පැහැදිලි කිරීම්.

05.1.1 මන්ත්‍රීතුමන්ලාගේ අදහස් වලට බොහොම ස්තූතියි. අපේ මධ්‍ය මහා විද්‍යාලයේ ආදිශීෂය සංගමය එකතුවෙලා හොඳ සංගීත ප්‍රසංගයක් ඉදිරිපත් කළා. ඒ සඳහා මට සහභාගී වෙන්න බැරි උණත් මම ආශිර්වාද කළා.
05.12 ඒ වගේම ජල ප්‍රශ්ණය සඳහා අපිට තියෙන්නේ System ප්‍රශ්ණයක් ඉතින් අපි ඔවුනට කිව්වා මේක නිරාකරනය කරලා දෙන්න කියලා. බලමු අපිට මේ සඳහා ඉක්මන් විසඳුමක් ගන්න බැරි උනොත් මම වෙන System එකකට යන්න කටයුතු කරනවා.

ගති වාර්තා හා වෙනත් ලිපිමාසික අයවැය සටහන් හා කර්මාන්ත පිළිබඳ ප්‍ර (ක)
1. 2025 දෙසැම්බර් මසට අදාල ආදායම් වියදම්.
2. 2026.01.31 දිනට ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය.

**සභාවේ නිමාව**

ගරු සභාපති ඩී.එස්.උයන්ගොඩ මැතිතුමා විසින් සභාවේ කටයුතු ප.ව 12.25 ට අවසන් කරන ලදි.

ඩී.එස්. උයන්ගොඩ
සභාපති
වත්තේගම නගර සභාව

....................................... දින පැවති මාසික මහා සභාවේ වාර්තාව සහා සම්මත කිරීම

සංශෝධන

.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................
..................................................

2026 ..................... මස........................වන දින පැවති, 2026 ...................මස මාසික මහා සභාවේ රැස්වීම් වාර්තාව ගරු නගර සභා උප සභාපති/ ගරු නගර සභා මන්ත්‍රී .......................................................................... මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නගර සභා උප සභාපති/ ගරු නගර සභා මන්ත්‍රී ....................................................................... මැතිතුමාගේ ස්ථිරත්වයෙන් 2026 ................. මස ................ දින පැවති මහා සභාවේදී ඒකමතිකව සහා සම්මත කරන ලදි.

ඩී.එස්. උයන්ගොඩ
ගරු සභාපති
වත්තේගම නගර